ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2020 සැප්තැම්බර් 16 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2020 අගෝස්තු

### 2020 අගෝස්තු මාසයේ දී නිෂ්පාදන සහ සේවා යන ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක වර්ධනය විය.

රටේ ව්‍යාපාරික කටයුතු යථාවත් වීම හේතුකොටගෙන 2020 අගෝස්තු මාසයේදී නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සිදුවූ අඛණ්ඩ වර්ධනය, නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙන් පිළිබිඹු විය. නව ඇණවුම් සහ නිෂ්පාදන යන උපදර්ශක දෙකම 2020 අගෝස්තු මාසයේදී ඉහළ ගිය අතර සේවා නියුක්තිය උපදර්ශකයේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි.

**නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.9**

**2020 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 6.7ක පහළ යෑමකි.**

නිෂ්පාදන ක්‍රියාකාරකම්වල සිදුවූ මෙම ඉහළයාම සඳහා ප්‍රධාන ලෙස ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශය දායක විය. ඉදිරි උත්සව සමයේ ඇතිවිය හැකි ඉල්ලුම පදනම් කර ගනිමින් නව සේවක බඳවා ගැනීම් සිදු කල බව මෙම අංශයේ සමහර ප්‍රතිචාර දක්වන්නන් විසින් අවධාරණය කරන ලදී.

නිෂ්පාදන සහ නව ඇණවුම් වල සිදුවූ ඉහළ යාමට සමගාමීව තොග මිලදී ගැනුම් ද අඩු වේගයකින් ඉහළ යන ලදී. සෘජු නැව් සේවා නොමැති වීම වැනි සැපයුම්වල සිදුවූ ගැටළු හේතුවෙන් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය වැඩි වේගයකින් ඉහළ යන ලදී.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවගේ දර්ශකය** | **64.6** | **57.9** | **-** | **අඩු වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උපදර්ශක** | | |
| නව ඇණවුම් | 69.5 | 58.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 73.7 | 57.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 51.6 | 54.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| තොග මිලදී ගැනුම් | 61.6 | 57.5 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 58.9 | 62.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

යන්ත්‍රෝපකරණ කොටස් ඇතුළු ඇතැම් භාණ්ඩ ආනයනය කිරීම සඳහා බලපැවැත්වෙන සීමාවන් සමහර නිෂ්පාදන කටයුතුවලට අහිතකර ලෙස බලපා ඇති බව ප්‍රතිචාර දැක්වූවන් අවධාරණය කරන ලදී.

ඉදිරි මාස තුන තුළ නිෂ්පාදන කටයුතු සඳහා වන සමස්ථ අපේක්ෂාවන් වැඩිවීමක් පෙන්නුම් කළ ද විශේෂයෙන්ම විදේශීය අංශයේ පවතින අඩු ඉල්ලුම් තත්වය, ව්‍යාපාර කටයුතු පූර්ව-කෝවිඩ් (Pre-COVID) මට්ටම කරා ලඟාවීම කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති බව නිෂ්පාදකයින්ගේ මතය වේ.

**ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

නිෂ්පාදන අංශයෙහි ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2020 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.2 කින් ඉහළ යමින් 2020 අගෝස්තු මාසයේදී 51.8 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2020 අගෝස්තු මාසයේදී එක්සත් රාජධානිය, චීනය, එක්සත් ජනපදය සහ යුරෝපා කලාපයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ඉහළ ගිය අතර COVID-19 වෛරසයේ අහිතකර බලපෑම හේතුවෙන් පනවා තිබූ සීමාවන් ලිහිල් කිරීමෙන් පසු රුසියාව සහ ඉන්දියාවේ නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය යහපත් අතට හැරෙමින් ධනාත්මක වර්ධනයක් පෙන්නුම්කර ඇත.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2020 සැප්තැම්බර් 15 වන දිනට*

*[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් 30 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.*

සේවා අංශයෙහි වර්ධනයක් අඛණ්ඩව තෙවන මාසයටත් පෙන්නුම් කරමින්, ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 අගෝස්තු මාසයේ දී 56.0 දක්වා ඉහළ යන ලදී. 2020 ජූලි මාසයට සාපේක්ෂව නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ව්‍යාපාර ක්‍රියාකාරකම්හි සිදු වූ ඉහළ යෑම මෙම වර්ධනය සඳහා දායක වූ අතර, එමගින් සේවා අංශයෙහි ක්‍රියාකාරකම් COVID-19 වසංගතයට පෙර පැවති මට්ටම දක්වා ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කෙරේ.

ආර්ථික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග, ප්‍රධාන වශයෙන්, මූල්‍ය සේවා, රක්ෂණ සහ ප්‍රවාහන උපඅංශයන්හි නව ව්‍යාපාර 2020 අගෝස්තු මාසයේ දී ඉහළ ගියේය.

ව්‍යාපාර ක්‍රියාකාරකම් උපදර්ශකය සිව්වන මාසයටත් අඛණ්ඩව ඉහළ යමින් 2020 අගෝස්තු මාසයේ දී 66.7ක් ලෙස වාර්තා වූ අතර, එමගින් සේවා අංශයෙහි ක්‍රියාකාරකම් වේගවත් ලෙස යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කෙරේ. ඇඟලුම් සහ ආරක්ෂිත මුහුණු ආවරණ අපනයනයෙහි ඇති වූ වර්ධනය හේතුවෙන් පසුගිය මාසයට සාපේක්ෂව 2020 අගෝස්තු මාසයේ දී ප්‍රවාහන උපඅංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් වර්ධනය විය. තවද, සංචාරක ප්‍රවර්ධන කටයුතු මගින් 2020 අගෝස්තු මාසයේ දී වැඩි දේශීය සංචාරකයන් ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට හැකි වූ බව නවාතැන් හා ආහාරපාන සැපයීමේ සේවා උපඅංශයෙහි ප්‍රතිචාර දක්වන්නන් විසින් සඳහන් කරන ලදී. එමෙන්ම, මූල්‍ය සේවා සහ අනෙකුත් පෞද්ගලික සේවා උපඅංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් ද 2020 අගෝස්තු මාසයේ දී වර්ධනය විය.

ඉල්ලුමෙහි සිදුවන ඉහළ යෑමක් පවත්නා ධාරිතාව තුළ සැපයීමට ඇති හැකියාව පෙන්නුම් කරමින් නිමකිරීමට නියමිත කාර්යයන් උපදර්ශකය තවදුරටත් කඩඉම් මට්ටමට වඩා පහළ අගයක පැවතුණි.

ඒ අනුව, කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද සේවකයන්ගේ සේවා ගිවිසුම් දීර්ඝ නොකිරීම සහ නව බඳවාගැනීම් සිදු නොකිරීම හේතුවෙන්, 2020 අගෝස්තු මාසයේ දී සේවා නියුක්තිය පහළ ගියේය.

| විචල්‍යය | ජූලි | අගෝ. | +/- | සාරාංශය |
| --- | --- | --- | --- | --- |
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **51.4** | **56.0** | **+** | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | **උපදර්ශක** | | | |
| නව ව්‍යාපාර | 53.5 | 58.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 61.0 | 66.7 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 36.8 | 45.8 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| සේවා නියුක්තිය | 40.0 | 38.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 65.5 | 70.8 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මේ අතර, ඉදිරි කාලයේ දී ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ දේශපාලන ස්ථායිතාව පිළිබඳ පවත්නා සුභවාදී අදහස් හේතුවෙන් අනාගත ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා 2020 අගෝස්තු මාසයේ දී තවදුරටත් ඉහළ ගියේය.

**සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**56.0**

**2020 ජූලි මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.6ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය**

අඛණ්ඩව දෙවන මාසයටත් ගෝලීය සේවා ක්‍රියාකාරකම්හි ඉහළ යෑමක් පෙන්නුම් කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2020 ජූලි මාසයේ දී වාර්තා වූ 50.6හි සිට 2020 අගෝස්තු මාසයේ දී 51.9 දක්වා ඉහළ ගිය අතර, එය මාස හතකින් වාර්තා වූ ඉහළම අගයයි.

ඇමරිකා එක්සත් ජනපදය, චීනය සහ එක්සත් රාජධානිය යන රටවල සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින්, එම රටවල සේවා අංශ පසුගිය මාසයට සාපේක්ෂව 2020 අගෝස්තු මාසයේ දී වර්ධනයක් පෙන්නුම් කරන ලද අතර, ජපානය සහ ඉන්දියාව යන රටවල එය පහළ යෑමක් පෙන්නුම් කළේය.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2020 සැප්තැම්බර් 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
| --- | --- |
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.